## රුහුණ විශ්වවිද්‍යාලය

## 2015/2016 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි - 3000 ස්ථලය

දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

## ECN 32513/ECN 32613 - ශ්‍රී ලංකාවේ ආර්ථිකය

**ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න.**

**කාලය : පැය 03**

---

01. (අ) ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්ත අංශයේ වර්ධනය මෙරට ග්‍රාමීය ආර්ථිකයට බලපෑ අන්දම පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(ආ) 'ද්විත්ව ආර්ථික ප්‍රපංචය' පැහැදිලි කොට ශ්‍රී ලංකාවේ යටත් විජිත ආර්ථිකය ද්විත්ව ආර්ථිකයක් වශයෙන් හැඳින්වීම කොතෙක් දුරට යෝග්‍යද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

02. 1948 - 1977 කාලච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ සුබසාධනයට නැඹුරු වූ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වූ ආකාරය තහවුරු කර ඒවා සමාජ - ආර්ථික සංවර්ධනයට සපයන ලද දායකත්වය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

03. '1977 හඳුන්වා දුන් ලිහිල් ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, ශ්‍රී ලංකා ආර්ථිකයේ සංදිස්ථානයක් සනිටුහන් කිරීමට සමත් විය.' එම ආර්ථික ප්‍රතිපත්ති මඟින් ඉටු කර ගැනීමට අපේක්ෂා කළ අරමුණු සහ ඒවා ආර්ථික සංවර්ධනයට කොතෙක් දුරට දායක වී ද යන්න විග්‍රහ කරන්න.

(ලකුණු 15)

04. (අ) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට කෘෂිකාර්මික අංශයේ කාර්ය භාරයයන් හඳුනා ගන්නේ කෙසේ ද? උදාහරණ සහිතව හේතු දක්වන්න.

(ලකුණු 08)

(ආ) වර්තමාන ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික දියුණුවට බාධාකාරී ලෙස ක්‍රියාත්මක වන්නා වූ සාධක කවරේ ද?

(ලකුණු 07)

05. (අ) රටක ආර්ථික වර්ධන ක්‍රියාවලිය තුළ කාර්මික අංශයේ දායකත්වය අවධාරණය කරනු ලබන න්‍යායාත්මක මහ පෙන්වීම් පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 07)

(ආ) කාර්මීකරණ ක්‍රියාවලියක් ආනයන ආදේශනය මත හෝ අපනයනයට නැඹුරු වීමක් මත හෝ පදනම් විය හැකි ය. මෙම ක්‍රමෝපාය දෙකෙහි ශක්තීන් හා දුර්වලතා සාකච්ඡා කරන්න.

(ලකුණු 08)



172

06. (අ) ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය (ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය) නිර්වචනය කරන්න.
(ලකුණු 02)

(ආ) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රම හමුදා සහභාගීත්ව අනුපාතිකය සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පැවතීමට හේතු කවරේ ද?
(ලකුණු 03)

(ඇ) ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපොළෙහි ඉල්ලුමෙහි හා සැපයුමෙහි ඇති නොගැලපෙන සුළු බව හඳුනා ගැනීම සඳහා ඔබ විසින් පාදක කරගන්නා කරුණු මොනවා ද?
(ලකුණු 05)

(ඈ) ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති ගැටලුවේ ව්‍යුහාත්මක ලක්ෂණ කෙටියෙන් සාකච්ඡා කරන්න.
(ලකුණු 05)

07. පහත සඳහන් ප්‍රකාශ පැහැදිලි කරන්න.

(අ) (i). සෑම මිල ඉහළ යාමක් ම උද්ධමනයක් නොවේ. (ලකුණු 02)

(ii). පූර්ණ සේවා නියුක්තියට පෙර ආර්ථිකයක උද්ධමනයක් හටගත නොහැක. (ලකුණු 03)

(iii) පූර්ණ සේවා නියුක්තියට නිශ්චිත සීමාවක් දැක්විය නොහැකි අතර ඒ ආසන්නයේ උද්ධමන ප්‍රවණතා ඇතිවිය හැකි ය.
(ලකුණු 03)

(ආ) උද්ධමනය පිළිබඳ සම්භාව්‍ය හා කේන්සියානු අදහස් පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.
(ලකුණු 07)

@@@@@@@@